අධ්‍යාපන අමාත්‍යාංශය
கல்வி அமைச்சு
Ministry of Education, Sri Lanka

62 | S | I, II

අ. පො. ස. සාමාන්‍ය පෙළ විභාගය - ශිෂ්‍ය සම්මන්ත්‍රණ මාලාව - 2022 (2023)
கல்விப் பொதுத் தராதரப் பத்திர (சாதாரண தர)ப் பரீட்சை- மாணவர் கருத்தரங்கு தொடர்- 2022 (2023)
G. C. E. Ordinary Level Examination – Student Seminar Series -

පුරවැසි අධ්‍යාපනය I, II
குடிமை கல்வி I, II
Civic Education I, II

පැය තුනයි.
மூன்று மணித்தியாலம்
Three Hours

අමතර කියවීම් කාලය - මිනිත්තු 10 යි.
மேலதிக வாசிப்பு நேரம் - 10 நிமிடங்கள்
Additional Reading Time – 10 minutes

අමතර කියවීම් කාලය ප්‍රශ්න පත්‍රය කියවා ප්‍රශ්න තෝරා ගැනීමටත් පිළිතුරු ලිවීමේ දී ප්‍රමුඛත්වය දෙන ප්‍රශ්න සංවිධානය කර ගැනීමටත් යොදා ගන්න.

## පුරවැසි අධ්‍යාපනය I

**සැලකිය යුතුයි:**

* **සියලු** ම ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
* අංක **1** සිට **40** තෙක් ප්‍රශ්නවල, දී ඇති (1), (2), (3), (4) යන පිළිතුරුවලින් **නිවැරදි හෝ වඩාත් සුදුසු** පිළිතුර තෝරාගන්න.
* **ඔබට සැපයෙන පිළිතුරු පත්‍රයේ එක් එක් ප්‍රශ්නය සඳහා දී ඇති කව අතුරෙන්, ඔබ තෝරා ගත් පිළිතුරෙහි අංකයට සැසඳෙන කවය තුළ (X ) ලකුණ යොදන්න.**
* එම පිළිතුරු පත්‍රයේ පිටුපස දී ඇති අනෙක් උපදෙස් ද සැලකිල්ලෙන් කියවා, ඒවා ද පිළිපදින්න.

1. ප්‍රජාතන්ත්‍රවාදී පාලන ක්‍රමයක විශේෂිත ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
   (1) පාලකයා අසීමාන්තික ලෙස බලය බුක්ති විඳීම
   (2) පුරවැසියන්ගේ සහභාගීත්වය අවම වීම
   (3) මාධ්‍ය නිදහස අවම මට්ටමක පැවතීම
   (4) ජනතා බලය පරමාධිපත්‍ය ලෙස සැලකීම

2. 1978 ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවට අනුව ජනාධිපති විසින් පත්කරනු ලබන පරිපාලන කටයුතු පිළිබඳ පාර්ලිමේන්තු කොමසාරිස්වරයා වන්නේ,
   (1) අගවිනිසුරුවරයා ය. (2) ඔම්බුඩ්ස්මන්වරයා ය.
   (3) පොලිස්පතිවරයා ය. (4) කතානායකවරයා ය.

3. ආණ්ඩුව,
   (1) සදාතනනික ආයතනයකි.
   (2) රාජ්‍යය හා සමාන වේ.
   (3) විවිධ ස්වරූප නොගනී.
   (4) රාජ්‍යයේ නියෝජිතයා වේ.

4. ස්විට්සර්ලන්තයේ ක්‍රියාත්මක වන ප්‍රාදේශීය ආණ්ඩු හඳුන්වනු ලබන්නේ,
   (1) ප්‍රාන්ත ලෙස ය. (2) සමූහාණ්ඩු ලෙස ය.
   (3) ප්‍රාදේශීය සභා ලෙස ය. (4) කැන්ටන් ලෙස ය.

5. ගැටුම් නිරාකරණය කිරීම සඳහා අධිකරණ ක්‍රියාවලිය භාවිතයට ගැනීම,
   (1) මැදිහත්කරණය යි. (2) සමථකරණය යි.
   (3) විනිසීම යි. (4) උපදේශනය යි.

6. පාරිභෝගික භාණ්ඩයක් හා අන්තර් භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
   (1) ඇඳුම් පැළඳුම්, ඛනිජ තෙල් (2) ආහාර ද්‍රව්‍ය, ඖෂධ
   (3) යන්ත්‍ර සූත්‍ර, ගෘහ භාණ්ඩ (4) ගොඩනැගිලි, සිමෙන්ති

7. ග්‍රීක යුගයේ ක්‍රියාත්මක වූ සෘජු ප්‍රජාතන්ත්‍රවාදය තුළ පැවති ලක්ෂණයක් වන්නේ මින් කුමක් ද?
   (1) ආණ්ඩු බලය විභේදනය කර නොතිබීම.
   (2) නගරවැසි ස්ත්‍රීන්ට ද ඡන්ද බලය හිමි වීම.
   (3) දේශපාලන බලය පාලකයින්ට පමණක් හිමි වීම.
   (4) දේශපාලන තීරණවලට සියලු දෙනා ම සහභාගි වීම.

8. ගැටුම් ඇති වීමට බලපාන මූලික හේතු දක්වමින් ත්‍රිකෝණ අරගල ගැටුම් ආකෘතිය හඳුන්වා දෙනු ලැබුවේ කවුරුන් ද?
   (1) ඊ. බී. ටයිලර් (2) මහාචාර්ය ගානර්
   (3) ජොහාන් ගැල්ටුන් (4) ප්ලේටෝ

9. මානව අයිතිවාසිකම් පිළිබඳ විශ්ව ප්‍රකාශනය එක්සත් ජාතීන්ගේ සංවිධානය විසින් සම්මත කරන ලද්දේ කවදා ද?
   (1) 1945 ඔක්තෝබර් 12 (2) 1945 දෙසැම්බර් 10
   (3) 1948 ඔක්තෝබර් 01 (4) 1948 දෙසැම්බර් 10

10. මිනිසා ද ඇතුළුව පරිසරයේ දක්නට ලැබෙන සියලු ම ශාක, සතුන් හා ක්ෂුද්‍ර ජීවීන් අයත් වන්නේ මින් කවර පිළිතුරට ද?
   (1) පාරිසරික සම්පත් (2) ජෛව සම්පත්
   (3) ස්වාභාවික සම්පත් (4) අජෛව සම්පත්

11. මරණ දඬුවම නියම වූවකුගේ එම දඬුවම ක්‍රියාත්මක කිරීමට අවශ්‍ය නිර්දේශය ජනාධිපතිවරයාට ලබා දෙන්නේ,
   (1) නීතිපතිවරයා ය. (2) අගවිනිසුරුවරයා ය.
   (3) ප්‍රධාන අමාත්‍යවරයා ය. (4) අධිකරණ අමාත්‍යවරයා ය.

12. සදාචාරාත්මක යුතුකම් ඉටු කිරීමේ විනිශ්චයකරුවා වන්නේ,
   (1) නීතිපතිවරයාගේ උපදෙස් ය. (2) අගවිනිසුරුවරයාගේ උපදෙස් ය.
   (3) අධිකරණ විනිසුරුවන් ය. (4) පුද්ගලයාගේ හෘදසාක්ෂිය ය.

13. ආර්ථික භාණ්ඩයක් හා ආර්ථික නොවන භාණ්ඩයක් පිළිවෙළින් දැක්වෙන පිළිතුර කුමක් ද?
   (1) ජලය හා ස්වර්ණාභරණ (2) ආහාර හා හිරු එළිය
   (3) වාතය හා ජලය (4) ආහාර හා ඇඳුම් පැළඳුම්

14. ආසියාන් සංවිධානයේ මූලස්ථානය පිහිටා ඇත්තේ කොහේ ද?
   (1) ඉන්දියාවේ නවදිල්ලියේ ය. (2) බංගලාදේශයේ ඩකාවල ය.
   (3) ඉන්දුනීසියාවේ ජකර්තාවල ය. (4) තායිලන්තයේ බැංකොක්හි ය.

15. අන්තර්ජාතික සහයෝගීතාව වර්ධනය කර ගැනීමට වඩාත් උපකාරී වන්නේ මින් කුමක් ද?
   (1) වටිනා පුරාවස්තු (2) යුධ ගැටුම්
   (3) සන්නිවේදන මාධ්‍ය (4) ස්වාභාවික විපත්

16. "දැනුම, ඇදහිලි, කලා, නීති, සිරිත් විරිත්, ඇගයීම් හා මිනිසා විසින් සමාජයේ ජීවත් වන පුද්ගලයෙකු වශයෙන් ලබා ගන්නා වූ පුරුදු, ඇබ්බැහිකම් හා හැකියාවන්ගේ සමස්තය සංස්කෘතිය යි." මෙලෙස විග්‍රහ කළේ,
   (1) චාර්ල්ස් ඒ. එල්වුඩ් ය. (2) ටී. බී. ටයිලර් ය.
   (3) සීලර් ය. (4) හැරල්ඩ් ජේ. ලැස්කි ය.

17. ඇමරිකා එක්සත් ජනපදයේ ව්‍යවස්ථාදායකය හඳුන්වනු ලබන්නේ කුමන නමකින් ද?
(1) ජාතික සභාව (2) සෙනෙට් සභාව
(3) කොංග්‍රස් මණ්ඩලය (4) සන්ධීය මහා මණ්ඩලය

18. ප්‍රජාතන්ත්‍රවාදී ජන සමාජයක ජනමාධ්‍ය සතු වගකීමක් වන්නේ,
(1) පවත්නා රජයේ ප්‍රතිපත්තිවලට පක්ෂපාතී වීම ය.
(2) සත්‍ය තොරතුරු හෙළි කිරීම හා සාරවත් දේ අගය කිරීම ය.
(3) ව්‍යවස්ථාදායකයේ හා විධායකයේ අදහස් නොසලකා හැරීම ය.
(4) ප්‍රජාතන්ත්‍රවාදී ජනමතය නියෝජනය නොකිරීම ය.

19. සිවිල් නීතිය යටතේ දඬුවම් හිමි වන වැරදි ක්‍රියාවක් වන්නේ, මින් කුමක් ද?
(1) මිනී මැරීම (2) සොරකම් කිරීම
(3) ළමා අපචාර සිදු කිරීම (4) ගිවිසුම් උල්ලංඝනය කිරීම

20. යටත්විජිත සමයේ දී සිදු කළ ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණ පිළිවෙළින් දක්වා ඇති පිළිතුර තෝරන්න.
(1) කෝල්බෲක්, කෲව් මැකලම්, මැනිං, මැනිං ඩෙවොන්ෂයර්, ඩොනමෝර්
(2) කෲව් මැකලම්, කෝල්බෲක්, මැනිං ඩෙවොන්ෂයර්, ඩොනමෝර්, මැනිං
(3) මැනිං, කෝල්බෲක්, කෲව් මැකලම්, මැනිං ඩෙවොන්ෂයර්, ඩොනමෝර්
(4) මැනිං ඩෙවොන්ෂයර්, ඩොනමෝර්, කෝල්බෲක්, කෲව් මැකලම්, මැනිං

21. පාර්ලිමේන්තුවේ තෙවන වර කියවා සම්මත වූ කෙටුම්පතක් නීතියක් බවට පත් වන්නේ පහත සඳහන් කවුරුන් විසින් අත්සන් තැබීමෙන් පසුව ද?
(1) අග්‍රාමාත්‍යවරයා (2) කථානායකවරයා
(3) මහකොමසාරිස්වරයා (4) ජනාධිපතිවරයා

22. නූතන රාජ්‍යවල බලය බෙදා හැරීමට හේතුවක් වන්නේ,
(1) විවිධත්වය තුළ එක්සත්කමක් ගොඩනැගීමේ අවශ්‍යතාව
(2) මධ්‍යම ආණ්ඩු පාලනය අකාර්යක්ෂම වීම
(3) අන්තර්ජාතික ආරක්ෂාව පවත්වා ගෙන යෑම
(4) ලෝක බලතුලනය පවත්වා ගෙන යෑම

23. ආර්ථිකයක සිදු වන ක්‍රියාවලි අනුපිළිවෙළින් දැක්වෙන පිළිතුර තෝරන්න.
(1) නිෂ්පාදනය, පරිභෝජනය, බෙදා හැරීම
(2) නිෂ්පාදනය, ගබඩා කිරීම, බෙදා හැරීම
(3) නිෂ්පාදනය, බෙදා හැරීම, ගබඩා කිරීම
(4) නිෂ්පාදනය, බෙදාහැරීම, පරිභෝජනය

24. මිනිසාට සිය සමාජ ජීවිතය සම්පූර්ණ කර ගැනීම සඳහා සමාජයෙන් ලැබෙන හිමිකම වන්නේ,
(1) අයිතිවාසිකම් ය. (2) වරප්‍රසාද ය.
(3) බලය යි. (4) නිදහස යි.

25. බහු සංස්කෘතික සමාජයක ජනතාව එක්සත් ව කටයුතු කිරීමෙන්,
(1) ජාතික සමගිය හා සහජීවනය වර්ධනය වේ.
(2) මිනිස් නිදහස හා අයිතිවාසිකම් ආරක්ෂා නොවේ.
(3) අන්‍යෝන්‍ය සුහදත්වය හා විශ්වාසය පළුදු වේ.
(4) රටේ භෞතික හා මානව සංවර්ධනය අඩාල වේ.

26. මධ්‍යගත සැලසුම් මණ්ඩලයක් මගින් ආර්ථික තීරණ ගනු ලබන්නේ, කුමන අර්ථ ක්‍රමයක් සහිත රටවල් විසින් ද?
(1) ධනවාදී (2) සමාජවාදී (3) මිශ්‍ර (4) වෙළඳපොළ

27. වාර්ගිකත්වය, දේශපාලනය, ආගමික මතවාද, සමාජ ආර්ථික තත්ත්ව යන සාධකයන් අයත් වන්නේ,
(1) ගැටුම් මූලවලට ය. (2) පුද්ගල ගැටුම්වලට ය.
(3) ගැටුම් වර්ගවලට ය. (4) ගැටුම් නිරාකරණ ක්‍රමවලට ය.

28. පුද්ගල මනසේ සාමය ඇති කර ගැනීම සඳහා යොමු විය හැකි අංශයක් **නොවන්නේ,**
(1) මානසික ආතතියෙන් කටයුතු කිරීම
(2) ආගමික වතාවත් කෙරෙහි යොමු වීම
(3) මනෝවිද්‍යාත්මක අභ්‍යාසවල යෙදීම
(4) ස්වාභාවික පරිසර නිරීක්ෂණය

29. ඉතා සංකීර්ණ වූ බහු සංස්කෘතියක් පවතින රටකට උදාහරණයක් වන්නේ,
(1) ශ්‍රී ලංකාවයි. (2) මහා බ්‍රිතාන්‍යයි.
(3) ඉන්දියාවයි. (4) මැලේසියාවයි.

30. ලෝකයේ ඇති ගෝලීය පරිමාණ ජාත්‍යන්තර සංවිධානයක් වන්නේ මින් කුමන සංවිධානය ද?
(1) සාර්ක් (2) පොදුරාජ්‍ය මණ්ඩලය
(3) එක්සත් ජාතීන්ගේ (4) නේටෝ

31. ශ්‍රී ලංකාවේ පළාත් පාලන ආයතනවලට පැවරී ඇති කාර්යයන් අතුරෙන් පොදු උපයෝගිතා සේවාවලට **අයත් නොවන** කාර්යයක් වන්නේ,
(1) පොදු ස්ථානවලට විදුලි ආලෝකය ලබා දීම
(2) මහජන වෙළඳපොළ පවත්වා ගෙන යෑම
(3) මහජන වැසිකිළි ඉදි කිරීම හා නඩත්තු කිරීම
(4) පොදු කියවීම් ශාලා පවත්වා ගෙන යෑම

32. අභියාචනාධිකරණය සතු බලතල පළාත් මට්ටමින් විමධ්‍යගත කිරීමේ අරමුණින් පිහිටුවනු ලැබූ අධිකරණය කුමක් ද?
(1) පළාත්බද මහාධිකරණය (2) මහාධිකරණය
(3) දිසා අධිකරණය (4) මහේස්ත්‍රාත් අධිකරණය

33. තිරසර සංවර්ධනයේ දී වැදගත් වන මූලික ම කරුණු ඇතුළත් නිවැරදි පිළිතුර වන්නේ,
(1) ස්වාභාවික සම්පත් සංරක්ෂණය, නිමැවුමට යොදා ගන්නා තාක්ෂණය
(2) පරිසරය ආරක්ෂා කර ගැනීම, අනාගත පරපුරේ අවශ්‍යතා ඉටු කර ගැනීම
(3) යහපත් ආකල්ප සංවර්ධනය, සමාජ සුරක්ෂිතතාව පවත්වා ගැනීම
(4) පරිසරය ආරක්ෂා කර ගැනීම, සමාජ සාධාරණත්වය ඉටු කර ගැනීම

34. රාජ්‍ය උපාය සම්බන්ධතා ශක්තිමත් කරලීමට ඉවහල් වන්නේ මින් කුමක් ද?
(1) යුධ විශේෂඥ දැනුම හුවමාරු කර ගැනීම
(2) හමුදා පුහුණුව ලබා ගැනීම
(3) ද්වි පාර්ශවීය රාජ්‍ය නායක හමුවීම්
(4) අවශ්‍ය අවි ආයුධ සැපයීම

35. රටේ සංවර්ධනය මැනීම සඳහා භාවිත කරන මිනුම් දෙ කොටසකට වර්ග කෙරෙන අතර, ඒවාට අදාළ මිනුම් ඒකක කිහිපයක් පහත දැක්වේ.
A. දළ ජාතික නිෂ්පාදිතය
B. භෞතික ජීවන තත්ත්ව දර්ශකය
C. ඒක පුද්ගල දළ ජාතික නිෂ්පාදිතය
D. මානව දරිද්‍රතා දර්ශකය
ඉහත මිනුම් ඒකක අතුරෙන් නූතන මිනුම් ඒකක වන්නේ,
(1) A හා B ය. (2) B හා C ය. (3) B හා D ය. (4) C හා D ය.

36. සිවිල් හා දේශපාලන අයිතිවාසිකම් පිළිබඳ අන්තර්ජාතික සම්මුතිය හා සම්බන්ධ පළමු වෛකල්පික සම්මුතියට අනුව,
(1) වරදකරුවෙකුට මරණ දඬුවම වෙනුවට වෙනත් විකල්ප දඬුවමක් ඉල්ලා සිටිය හැකි ය.
(2) අතීතයට බලපාන අයුරින් පනවන දඬුවම්වලින් මිදී සිටිය හැකි ය.
(3) ළමයින් පැහැරගෙන යාමට හෝ බලහත්කාරයෙන් රඳවා තබා ගැනීමට විරුද්ධව දඬුවම් පැමිණවිය හැකි ය.
(4) තම රටේ යුක්තිය පසිඳලීමෙන් සෑහීමකට පත් නොවේ නම්, මානව හිමිකම් කඩවීම් පිළිබඳව මානව හිමිකම් කමිටුවට පැමිණිලි කළ හැකි ය.

37. 1947 සෝල්බරි ආණ්ඩුක්‍රම ප්‍රතිසංස්කරණය හා සම්බන්ධ වැදගත් සිදුවීමක් පහත සඳහන් දෑ අතුරෙන් තෝරන්න.
(1) සීමිත ඡන්දබලය හඳුන්වා දීම
(2) සුළු ජාතීන්ට අයිතිවාසිකම් හිමිකර දීම
(3) සර්වජන ඡන්දබලය හඳුන්වා දීම
(4) පළාත්බද නියෝජන ක්‍රමය හඳුන්වා දීම

❖ පහත දැක්වෙන්නේ ඒකීය හා සන්ධීය ආණ්ඩුක්‍රමවල අඩංගු මූලික ලක්ෂණ කිහිපයකි. ඒවා අනුසාරයෙන් 38 හා 39 ප්‍රශ්නවලට පිළිතුරු සපයන්න.
A එක් මධ්‍යම බල අධිකාරියක් තුළ බලය සංකේන්ද්‍රණය වීම
B බලය මධ්‍යම හා ප්‍රාදේශීය පාලන ආයතන අතර බෙදී පවතින අතර, ආපසු පවරා ගැනීමේ හැකියාව පැවතීම
C තල දෙකක ආණ්ඩු ක්‍රියාත්මක වීම
D බලය ක්‍රියාත්මක කිරීමේ ප්‍රධාන වගකීම මධ්‍යම ආණ්ඩුව සතු වීම
E ලිඛිත ආණ්ඩුක්‍රම ව්‍යවස්ථාවක් තිබීම
F ඉහළ මන්ත්‍රණ සභාවක් පැවතීම

38. ඒකීය ආණ්ඩුක්‍රමයකට අදාළ ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) ABD (2) ACD (3) BDE (4) DEF

39. සන්ධීය ආණ්ඩුක්‍රමයකට අදාළ ලක්ෂණ පමණක් අඩංගු කාණ්ඩය තෝරන්න.
(1) BEF (2) CDF (3) CEF (4) DEF

40. ශ්‍රී ලංකාවේ මානව හිමිකම් ක්‍රියාත්මක කිරීම හා සම්බන්ධ පහත දැක්වෙන ප්‍රකාශ අතුරෙන් **අසත්‍ය ප්‍රකාශය** තෝරන්න.
(1) යම් විධායක හෝ පරිපාලන ක්‍රියාවක් මගින් මූලික අයිතිවාසිකම් කඩ වීමක දී ශ්‍රේෂ්ඨාධිකරණයට පැමිණිලි කළ හැකි ය.
(2) මූලික අයිතිවාසිකම් කඩ වීම පිළිබඳ පැමිණිලි විමර්ශනය කිරීමේ බලය ශ්‍රී ලංකා මානව හිමිකම් කොමිසම සතු ය.
(3) ඕනෑ ම පුද්ගලයෙකුට මානව හිමිකම් කඩ වීම සම්බන්ධ නඩු එක්සත් ජාතීන්ගේ මානව හිමිකම් කමිටුව වෙත පැමිණිලි කළ හැකි ය.
(4) මානව හිමිකම් කඩ කිරීමක් සම්බන්ධ ව පැමිණිලි විභාග කොට වරදකරුවන්ට දඬුවම් කිරීමේ බලය පාර්ලිමේන්තු කොමසාරිස්වරයා සතු වීම.

*****